කලාප අධ්‍යාපන කාර්යාලය - කොළඹ
வலயக் கல்வி காரியாலயம் - கொழும்பு
Zonal Education Office - Colombo
අ.පො.ස.(සා/පෙළ) විභාගය - ආදර්ශ ප්‍රශ්න පත්‍රය
க.பொ.த. (சா/த) பரீட்சை - மாதிரி வினாத்தாள்
G.C.E.(O/Level) Examination - Model Paper

| 11 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය i | කාලය: පැය 1 |
|---|---|---|---|

සැලකිය යුතුයි :

i. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 කි.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල i, ii, iii, iv පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරාගන්න.
iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරේ අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
iv. එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

❖ අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

01. බලාපොරොත්තු වූ කාරණය කිරිගහට ඇන්නා වගේ ඉටුවන බව ඔහු පැවසී ය.

(i) ඉතාම පිරිසිදුව (ii) ඒකාන්තයෙන් ම ප්‍රතිඵල ලැබෙන ලෙස
(iii) අවදානමෙන් මිදී (iv) කිසිවෙකුට කරදරයක් නැති ව

02. සිද්ධවෙච්ච දේ පැදුරෙන් බිමට වැටීමක් බව පවසමින් අම්මා දරුවන් සැනසුවා ය.

(i) වැඩි වෙනසක් නොවීම.
(ii) කරදරයකින් තවත් කරදරයක් ට පත්වීම.
(iii) අභාග්‍ය සම්පන්න ඉරණමකට මුහුණ දීම
(iv) සැනසිල්ලක් දැනීම

03. තමා අතපල්ලෙන් වැටුන කෙනෙකු නොවන බව ඔහු ප්‍රසිද්ධියේ ම පැවසුවේ ය.

(i) නොවැදගත් (ii) අනවශ්‍ය
(iii) දුර්වල (iv) විනාශකාරී

❖ අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවලට හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**04.** අප සියලු දෙනා ම දේශීය භාණ්ඩ ................. පුරුදු වුවහොත් විදේශ විනිමය ඉතිරි කර ගැනීම අපහසු නො වේ.

| | | | |
|---|---|---|---|
| (i) | පරිමාණයට | (ii) | පෝෂණයට |
| (iii) | පරිහරණයට | (iv) | විස්තාරණයට |

**05.** අප අතරින් බලවතුන්, උගතුන් සෙවිය හැකිය. එහෙත් ................. මිනිසුන් සෙවීම ඉතා දුෂ්කර ය.

| | | | |
|---|---|---|---|
| (i) | ධනවත් | (ii) | නැණවත් |
| (iii) | වංශවත් | (iv) | සුචරිතවත් |

**06.** තම රටේ දියුණුව සඳහා ................. කැපවීමකින් ක්‍රියාකළ රණවිරුවන් කාගේත් පැසසුමට ලක්විය යුතුය.

| | | | |
|---|---|---|---|
| (i) | නිර්මිත | (ii) | අසීමිත |
| (iii) | යෝග්‍ය | (iv) | ප්‍රශංසනීය |

**07.** සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(i) ප්‍රාසාංගික, ලේඛණ, කෘත්‍රිම, දෘශ්‍ය

(ii) නීත්‍යානුකූල, පෘථිවිය, අඝෝෂ, දෘෂ්ටිය

(iii) ලේකම්, ඛනිජ, රිද්මානුකූල, විද්‍යමාන

(iv) කතෘ, විශිෂ්ට, නිෂ්ඵල, කොට්ඨාස

**08.** <u>රු</u>වල, <u>රූ</u>හැයියා, <u>රී</u>තිය, <u>රා</u>ගය යන වචනවල පළමු අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(i) ඇදය, පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, ඇලපිල්ල

(ii) ඇලපිල්ල, පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, ඇදය

(iii) ඇදය, දීර්ඝ ඇදය, දීර්ඝ ඉස්පිල්ල, පාපිල්ල

(iv) පාපිල්ල, ඇදය, දීර්ඝ ඉස්පිල්ල, ඇලපිල්ල

**09.** 'කතරගම' යන පදයෙහි අන්තර්ගත අඝෝෂ අක්ෂර වනුයේ

| | | | |
|---|---|---|---|
| (i) | ක, ත | (ii) | ග, ම |
| (iii) | ත, ර | (iv) | ග, ත |

10. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.

(i) දළදා සිරිත, පූජාවලිය, රත්නාවලිය, බෝධිවංශය

(ii) ගුණරත්න, චන්ද්‍රදාස, ජයරත්න, මොහොමඩ්

(iii) කෑගල්ල, ගම්පොළ, මාතර, නුගේගොඩ

(iv) ප්‍රංශය, රුවන්ඩාව, නයිජීරියාව, තායිලන්තය

11. උක්ත නාමපද පමණක් යෙදී ඇති වරණය තෝරගන්න.

(i) සතුරා, ළමයෙක්, කාන්තාවක, ගංගාවක්

(ii) ඈ, රෝගීහු, නායකයෝ, මම

(iii) අපි, ඔවුන්, ඇය, හෙතෙම

(iv) ඕතොමෝ, වීදීහු, රාජාදීන්, මැණියන්දෑ

12. කුකුළන් යන පදයේ ප්‍රකෘතිය සහ ප්‍රත්‍යය නිවැරදි ව දැක්වෙන වරණය වන්නේ

(i) කුකුළු + අන් (ii) කුකුළු + උන්

(iii) කුකුළා + අන් (iv) කුකුලු + ඉන්

13. සාගර පත්ලෙහි අනවශ්‍ය දෑ <u>තැන්පත් වීමෙන්</u> එය දූෂණය වන බව පරිසරවේදීහු පවසති.

ඉහත ඉරි ඇඳි පදය අයත් වන්නේ,

(i) ප්‍රථමා විභක්තියට (ii) කරණ විභක්තියට

(iii) ආධාර විභක්තියට (iv) සම්ප්‍රදාන විභක්තියට

14. උපසර්ග පද පමණක් අතුළත් පිළිතුර තෝරන්න.

(i) උගත්, පිරිසිදු, අපිචර්ම, පබඳ (ii) උපභාෂා, භාවිතය, විමුක්ති, අනුභාව

(iii) අපනයන, සද්භාව, සිහින, අවශ්‍ය (iv) අභ්‍යවකාශ, කුකවි, නිස්සාර, සුන්දර

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(i) නිපාත - ඉතා, පාසා, වන, විසින්

(ii) සන්ධි - කොග්ගල, රුවනාර, දකුණත, මහින්දාගමනය

(iii) ක්‍රියා - ගයා, සොයමින්, සදත, නිදා

(iv) ධාතු ප්‍රකෘති - මර, නර, කප, කොට

**16.** ප්‍රයෝජ්‍ය ක්‍රියාවක් යෙදී නැති වරණය තෝරන්න.

**(i)** සොයවයි, නටවති, ගයවයි, නරඹවයි

**(ii)** අඩවයි, තෝරයි, විමසවයි, පසසවයි

**(iii)** වයවයි, නිදවයි, කරවති, කපවයි

**(iv)** නාවවයි, සනසවයි, කොටවයි, ලියවයි

❖ අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

**17.** ඒ <u>අසේ ව</u> වැදහොත් වඳුරා කෙරෙහි කළ අපරාධ නිසා ඔහු මහත් පාපයක් කරගත්තේ ය.

**(i)** ශක්තිමත් ව **(ii)** කුසගින්නෙන්

**(iii)** නිදිබර ව **(iv)** වෙහෙස ව

**18.** "තා මේ විදියට <u>හළුයේ</u> තෙල කුමරයා නිසා නොවෙයි".

**(i)** පැමිණියේ **(ii)** නො පැමිණියේ

**(iii)** මුදා හැරියේ **(iv)** ඉවත්වූයේ

**19.** සම්බුද්ධ ශාසනයේ <u>චිරස්ථිතියට</u> උන්වහන්සේ අපමණ දායකත්වයක් දැක්වූ සේක.

**(i)** අමන්දානන්දයට **(ii)** බොහෝ කල් පැවතිමට

**(iii)** ශක්තියට **(iv)** යාවත්කාලීන වීමට

**20.** දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී නො පවත්නා පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.

**(i)** උපමා, රූපක, අතිශයෝක්ති, වක්‍රෝක්ති

**(ii)** දිය හොල්මන, සේරංගාව, කුරුලුපාලුව, අතුවැල

**(iii)** උබර, කොඹර, වගා ඉස්සර, වගා පංගුව

**(iv)** වියල් ඕරු, ජාලය, අළුහන් වැඩීම, අලුයම්පොළ

**21.** එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.

**(i)** සැකය - සංශය, කුකුස, අනුමානය, ආයාසය

**(ii)** ප්‍රයත්න - වීර්යය, උත්සහය, ප්‍රමෝදය, වෑයම

**(iii)** විශාල - නැඹල, මහත්, පෘථුල, විපුල

**(iv)** ගගන - සුරමග, නුබ, ගුවන්ගැබ, රුවනාර

**22.** මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(i) අභිමුඛ - අනභිමුඛ    (ii) නිරර්ථක - සාර්ථක

(iii) ප්‍රතික්ෂේප - ප්‍රතිග්‍රහණ    (iv) විමල - නිර්මල

**23.** මුලින් දී ඇති පදයට බහු අර්ථයක් නො දෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(i) සතර - ශාස්ත්‍ර, සතුරු, චතුර්, උතුම්

(ii) රා - සුරා, රාහු, රාගය, හඬ

(iii) සේ - ඡායාව, වැනි, රශ්මිය, සුදු

(iv) නා - නායක, නාග, ඇත්, ප්‍රධාන

**24.** වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(i) 'ඤ' හා 'ඥ' තනි ශබ්ද ලෙස හැඳින්වේ.

(ii) ව්‍යඤ්ජනයකට පසුව යෙදෙන 'ය' වෙනුවට යංශය භාවිත වේ.

(iii) ඌෂ්මාක්ෂර හැඳින්වීමට අර්ධ ස්වර යන නම ද භාවිත වේ.

(iv) නුඹ යන පදයේ අනුක්ත රූපය "නුඹ" වේ.

**25.** පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍ය තෝරන්න.

(i) අවස්ථෝචිත පරිදි වියත්වහර හා කටවහර මත අර්ථය අනුභූත වෙයි.

(ii) වටහා ගත නො හැකි තරම් එය කියවීම ඔබට ලේඛනයකි.

(iii) පුවත්පත් කලාවේදියා ප්‍රවෘත්තිය ජාතික පුවත්පතකට නො වැදගත්ය.

(iv) සාහිත්‍ය කෘතියක අන්තර්ගතය නිර්මාණ කරුවාගේ ඇත්දැකීම් මත පදනම් වෙයි.

❖ අංක 26, 27 ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

**26.** උදව්වක් කර යමක් බලාපොරොත්තු වීම.

(i) කලුවා මාරපන් ගියා වගේ

(ii) අත දී ලා දන නියවනව වගේ

(iii) ඔන්චිල්ලාව එහාට ගියත් මෙහාට එනවලු

(iv) අබරා සිල්ගත්තා වගේ

**27.** අගයක් නොමැති වීම,

(i) වක්කඩේ හකුරු හැංගුවා වගේ

(ii) කැලේට පායපු හඳ වගේ

(iii) ආඳා යවා තබාලා වලපත ගත්තා වගේ

(iv) නයයි පොළඟයි වගේ

**28.** ගාත්‍රාදේශ සන්ධියට සහ ආගම සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(i) කටුඅත්ත, නෙලුම්මල් (ii) අනුරුත්, මැදගිල්ල

(iii) දහවල්, වටොර (iv) බුත්සරණ, කවියා

❖ අංක 29, 30 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

**29.** (i) අනාගත නායකයන් ප්‍රඥාවන්තයන් වෙත්වා!

(ii) බිසවු තොමෝ සන්සුන් ව ගමන් කළා ය.

(iii) වැඩිහිටියන් දෙන නිවැරදි උපදෙස්වලට දරුවෝ විරුද්ධ වන්නේ නැත.

(iv) නාට්‍ය විචාරයකයන් ප්‍රේක්ෂකයෝ දැනුවත් කරති.

**30.** (i) ලාංකික ක්‍රීඩකයන් පරදිති'යි ක්‍රිකට් ලෝලීන් නොසිතූ හ.

(ii) නා හිමි උදෙන් ම අවදි වෙති.

(iii) නිවැසියෝ මහත් හරසරින් මා පිළිගත්හ.

(iv) අම්මා නොහොත් මව අප ආදරයෙන් රකින්නීය.

**31.**

- ශ්‍රී ලාංකිකයන් ................. පවත්නා ආගන්තුක සත්කාරය අගය කළ යුතු ය.
- මනමේ කුමරිය ................ ප්‍රේක්ෂක අනුකම්පාව යොමු විය.
- සර්පයෙකු දුටු ................ දැරිය බියෙන් තැතිගත්තා ය.
- එම නිවාඩු නිකේතනවල මිල අධික ............... ඔවුහු නැවත පිටත් වූහ.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක්ද?

(i) බැවින්, කෙරෙහි, තුළ, විගස

(ii) තුළ, කෙරෙහි, විගස, බැවින්

(iii) තුළ, විගස, බැවින්, කෙරෙහි

(iv) විගස, කෙරෙහි, බැවින්, තුල

32. පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැර වූ වඩාත් නිවැරදි වන්නේ කුමක්ද?

- උන් හුඟක් දේ දන්නවා

(i) ඔවුන් බොහෝ දේ නොදනිති. (ii) ඔවුහු බොහෝ දේ දනිති.

(iii) ඔවුන් ඇතැම් දේ දනියි. (iv) ඔවුහු කිසිවක් නොදනිති.

33. පහත දැක්වෙන කවියේ හතරවන පදය දැක්වෙන වරණය තෝරන්න.

වහිනවා වහිනවා වහිනවා වහිනවා

ගල් ගහන්නා වගේ වතුර කැට වැටෙනවා

කළු වලා කැලඹෙහින් මුදුන් වී නැඟෙනවා

.......................................................

(i) හෝ ගමින් අපේ ගමට වැස්සක් එනවා

(ii) ආකාසේ හඬ නළමින් අකුණු හඬනවා

(iii) වලාකුළේ රන් පාටට විදුලි කොටනවා

(iv) අකුණු ගෙඩි ගිගුම් දී විදුලි ඉරි දුවනවා

34. "මැක්බත්" යන නිර්මාණයෙහි රචකයා වන්නේ

(i) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් (ii) ර් යූ නොසුකෙ අකුතගාවා

(iii) විලියම් ශේක්ස්පියර් (iv) ඇන්ටන් චෙකොෆ්

35. පහත දැක්වෙන කවි දෙපදයේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

සැඳෑ සඳුට සදමින් මග නිසා කත

ඉසි වැනි නිමල් මලිගිය මල් සිය දිමුත

(i) බොහෝ මැණික්වල ඡායාව සූර්යයා දෙසට සමීපව අහසට පිවිසුණු විට සමුද්‍රය තම තරංග නැමති අත්වලින් උසුලාගෙන සූර්යයාගේ වෙහෙස දුරු කිරීමට උත්සාහ කරයි.

(ii) තාරක සමූහය බබළන්නේ බොහෝ මැණික්වල ඡායාව ආකාශය නැමති කැටපතෙහි දර්ශනය වන විට ය. සන්ධ්‍යාවේ ඉර බැස යන්නෙන් උදැසන හිරු පායා එන්නේ එවිට ය.

(iii) චන්ද්‍රයා පායා එන විට සමුද්‍රය තමා කරා ඇද ගැනීමට තාරකා සමූහය බලා සිටියි. මන්ද රාත්‍රිය උදාවන්නේ එවැනි මොහොතක ය.

(iv) රාත්‍රිය නමැති කාන්තාව සන්ධ්‍යාවේ පායා එන චන්ද්‍රයාට මාර්ගය සරසමින් දීප්තිමත් මල් සමූහයක් විසුරුවා හැරියාක් මෙන් තාරකා සමූහය බබළයි.

**36.** බසේ කිලිටිකම නැණ සිසිලෙන් දොවනා

රැසේ සියල්ලන් හට නව පණ පොවනා

ඉහත පද්‍ය පාදයන්හී ඇතුළත් රූපකය වන්නේ,

(i) බසේ කිලිටිකම (ii) රැසේ සියල්ලන්

(iii) නැණ සිසිලෙන් (iv) නව පණ

**37.** 'වතුර මල' කෙටිකතාවෙහි ඇතුළත් නො වන චරිතයක් වන්නේ

(i) සියදොරිස් (ii) සිරිමාන්න

(ii) අබිලින් (iv) ලොකු හාමුදුරුවෝ

**38.** ශ්‍රී ලංකාවෙහි වර්තමාන විශ්ව විද්‍යාල පද්ධතිය ආරම්භ කිරීමෙහි පුරෝගාමියා වන්නේ,

(i) මහචාර්ය විමල් ජී. බලගල්ලේ (ii) මහාචාර්ය ජේ.බී. දිසානායක

(iii) ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් (iv) ආචාර්ය ජී.බී. හැරිසන්

**39.** දිගාමඩුලු උපභාෂාවෙහි 'කායම' යනුවෙන් හැඳින්වෙන්නේ

(i) හෙවණැල්ල (ii) හොද්ද

(iii) කිරිබත් (iv) උදෑසන

**40.** පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

සංවර්ධනය වෙමින් පවතින රටවල පොදු ජනතාවට අලුත් ම විද්‍යාත්මක සිදුවීම් ගැන දැන ගන්නට සැලැස්වීමේ බලවත් අවශ්‍යතාවක් තිබේ.

(i) විද්‍යාවේ ඇතිවන නව ප්‍රවණතා පිළිබඳ ව සංවර්ධනය වෙමින් පවතින රටවල ජනතාව දැනුවත් කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී.

(ii) නව විද්‍යාත්මක ප්‍රවණතා පිළිබඳ ව අනිවාර්යයෙන් දැනගත යුත්තේ සංවර්ධනය වෙමින් පවතින රටවල ජනතාවයි.

(iii) සංවර්ධනය වන රටවල ජනතාව විද්‍යාවේ නව ප්‍රවණතා පිළිබඳව දැනුවත් වීම අවශ්‍ය වේ.

(iv) සංවර්ධනය වෙමින් පවතින රටවල ජනතාව විද්‍යාත්මක නව සංකල්ප පිළිබඳ ව දැනගෙන තිබීම අනිවාර්ය අවශ්‍යතාවය කි.

කලාප අධ්‍යාපන කාර්යාලය - කොළඹ
வலயக் கல்வி காரியாலயம் - கொழும்பு
Zonal Education Office - Colombo
අ.පො.ස.(සා/පෙළ) විභාගය - ආදර්ශ ප්‍රශ්න පත්‍රය
க.பொ.த. (சா/த) பரீட்சை - மாதிரி வினாத்தாள்
G.C.E.(O/Level) Examination - Model Paper

| 11 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය ii | කාලය: පැය 2 |
|---|---|---|---|

<u>සැලකිය යුතුයි</u> :

- ❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❖ මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු ගණන 80 කි.

**1.** **(i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

**(i)** සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් අනුනාසිකා අක්ෂර දෙකක් ලියන්න.

**(ii)** පහත සඳහන් පදවල අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.

(අ) මුලු (ආ) මුළු

**(iii)** පහත සඳහන් පද විසන්ධි කර ලියන්න.

(අ) රුවනාර (ආ) කොග්ගල

**(iv)** පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

(අ) සංකෝචනය (ආ) පිරිහීම

**(v)** පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති ලියන්න.

(අ) ස්වාමීන් වහන්සේලා <u>දන් පිණිස</u> වෙහෙරට වැඩිසේක.

(ආ) සිසුහු <u>අන්තර්ජාලයෙන්</u> ඉගෙනුම් කටයුතු කරති.

**(vi)** පහත සඳහන් වාක්‍යයේ ඉරි ඇඳි පද අයත් වන ක්‍රියා පද ප්‍රවර්ගය ලියන්න.

වෛද්‍යවරුන් රෝගීන් පරීක්ෂා <u>කරන විට</u> තම වාරය පැමිණෙන තෙක් රෝගීහු <u>සූදානම් වී</u> සිටියහ.

**(vii)** පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.

(අ) ගුරුවරු පරිගණක භාවිතයෙන් උගන්වනු ඇත.

(ආ) රටවැසියෝ සෞඛ්‍ය නීති පිළිපදිමු 'යි අපි සිතමු.

(viii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් අව්‍යය පද දෙකක් ලියන්න.

අපි නිවහල් දේශයක් උදෙසා සැමවිටම කැප වී ක්‍රියාකරමු.

(ix) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) දෙමාපියෝ තම දරුවන් යහපතෙහි යොදවති.

(ආ) කුරුල්ලා අතු අගට පැන පලතුරු කෑවේය.

(x) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) උසට ගැළපෙන මහතින් යුත්

(ආ) අනුන් විසින් පෝෂණය කරන

**(ලකුණු 2x10 = 20 )**

2. පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නො අඩු වන සේ රචනාවක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) අවවාදයට වඩා ආදර්ශය උතුම් බව අපි අසා ඇත්තෙමු. ලොව පහළ වූ බුදුවරු, ශාස්තෘවරු, දාර්ශනිකයෝ වූ අය වුහ. එබැවින් එකී උත්තමයන් විසින් දෙන ලද අවවාද සැම දෙනාගේ ම අවධානයට ලක්විය. සැමට ම ඵලදායක විය. යහපත් ක්‍රියාවල යෙදීම සේම අයහපත් යයි සැලකෙන ක්‍රියාවලින් මිදීම ආදර්ශයේ ප්‍රධාන ලක්ෂණයකි.

(ආ) ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් පාසල් දරුවෝ වෙති. එබැවින් මේ තරුණ ශිෂ්‍ය පරම්පරාව පිළිබඳව සැමදෙනාගේ ම අවධානය යොමුවිය යුතුය. ජාතියේ ජීවනාලිය බඳු මොවුන් පාසල තුළ දී මෙන් ම ඉන් බාහිරවත් රැකගැනීම වැඩිහිටියන්ගේ වගකීමයි. නමුත් මේ තත්වයේ දී සිසුන් වන අපට ද වගකීමක් පැවරී ඇත. එනම් තම අරමුණු කරා යනතුරු මනා සංයමයකින් මෙන් ම අවබෝධයකින් ද කටයුතු කිරීමයි.

(ඉ) අප රට තවමත් කෘෂිකර්මාන්තයෙන් දියුණු කළ හැකි තත්වයක පවතී. මේ ඇසුරෙන් කෙටිකාලීන සහ දිගුකාලීන සංවර්ධන සැලැස්මක් අවශ්‍ය වේ. අපේ රටට අවශ්‍ය ආහාර භෝග නිෂ්පාදනය කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැගිය යුතුය. ඒ සඳහා රටේ බාල තරුණ මහලු ආදී වශයෙන් සැලකෙන කොටස්වල දායකත්වය ලබාගත යුතුය. සැම පාසලකම රටේ පත්කර කෘෂිකර්මය අධ්‍යාපන විෂයමාලාවේ අනිවාර්ය විෂයයක් බවට පත්කළ යුතුය.

(ඊ) ජාතික සමගිය ගොඩ නැගීමටත් නිවහල් නිරෝගී දරු පරපුරක් බිහි කිරීමටත් ඉවහල් වන විෂයයක් ලෙස ක්‍රීඩා විෂයය හැඳින්විය හැකියි. පුද්ගලයන් තුළ ඇතිවන විවිධ ආතතික හැඟීම් පාලනය කර ගැනීමටත් ගැටලු පැනනගින විට ඒවා විසඳා ගැනීමටත් එකිනෙකා සමග සහජීවනයෙන් යුතුව කටයුතු කිරීමටත් ක්‍රීඩාව ප්‍රයෝජනවත් වේ.

**(ලකුණු 25 )**

**3.** පහත දැක්වෙන පාඨය වචන **55 – 65** වන සේ සාරාංශ කර ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව ද සාරාංශය අග ලියන්න.

රටක ආර්ථික දියුණුව හා කලාව අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවයකි. රටක ආර්ථිකය දියුණු වූ පමණින් එරට සංවර්ධිත රටක් ලෙස පිළිනොගනී. කලා නිර්මාණයක් රස විඳීමේ මානසික තත්වයක් ඇති මිනිස් සමාජය රටක සංවර්ධනයට ආර්ථික දියුණුව මෙන් ම වැදගත් වේ. කලා නිර්මාණ ලෙස පිළිගනු ලබන නාට්‍යයක් නරඹන විට ද සංගීත නිර්මාණයකට සවන් දෙන මොහොතේ දී ද රසික සිත් තුළ ජනිතවන කම්පනය හේතු කොට ගෙන ඔහු එම කෘතිය හා සංවේදී තත්වයකට පත් වේ. ඒ ඒ අවස්ථාව අනුව ප්‍රීතිය, ශෝකය හා විස්මය යන හැඟීම් රසික සිත් තුළ පහළ වේ. මෙලෙස කලාවට ළැදිවීමෙන් සංවේදී හදවතක් ලබන රසිකයා තම දේශයේ ඉදිරි ගමනට අතහිත දෙන්නෙකු බවට පත් වේ. මෙලෙස ඔහු කලාවෙන් ලැබූ පුද්ගල සංවර්ධනය රටේ සංවර්ධන ක්‍රියාවලියට මග සලසයි. මේ ආකාරයෙන් රචකයා තම කලා නිර්මාණ මගින් ද රසිකයා එම නිර්මාණ රස විඳීම තුළින් ද රටේ දියුණුව කරන්නේ මහඟු සේවයකි. කලා කෘතියක් මගින් සහෘදයාට අණ දීමක් සිදු නොවන අතර ආස්වාදයක් ලබාදීම ප්‍රධානතම පරමාර්ථය වේ. කලා නිර්මාණයක අඩංගු චරිත, සමාජ පසුබිම, එහි භාෂාව රචනෝපක්‍රම ආදී සියල්ල ම රසික වින්දනයට ඉවහල් වේ. එමෙන් ම උසස් චිත්‍රපටයක නම් කතාව, නළු නිළියන්ගේ රඟපෑම් ආදිය රසික හදවත් චමත්කාරයෙන් පුරවාලීමට හේතු වේ. මේ කරුණු අනුව කලා කෘතියක රසය පටු අරුතක් ගෙනදෙන්නක් නො වන අතර අර්ථවත් සැබෑ මිනිසෙකු සමාජයට දායාද කිරීමට හේතුවන බව මනා ව පැහැදිලි වේ.

රසවින්දනය තුළින් සමාජ යථාර්ථය වටහා ගන්නා රසිකයා භාවමය හා ඥානමය අතින් වර්ධනය වේ. එසේ නම් මෙවැනි මානසික තත්වයක් ඇති පුද්ගලයා සමාජ සංවර්ධනයට සෘජුව ම දායක වන බව ඉතා පැහැදිලි කරුණකි. කලාකරුවා හා රසිකයා තුළින් එම මහඟු කාර්යය ඉටු වන බැවින් දේශයක දියුණුවට කලා නිර්මාණ ප්‍රබලතම සාධකයක් බව මෙහි දී පැහැදිලි වෙයි.

**(ලකුණු 10 )**

**4.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

අනාගත ලෝකය ඉදිරි කාලයේ දී මුහුණපාන විශාල ම ව්‍යසනය ලෙස පරිසරවේදීන් අර්ථකථනය දක්වන්නේ සාරවත් වූ විශාල බිම් පෙදෙසේ කාන්තාර බවට පත්වීමයි. මේ කාරණය සම්බන්ධයෙන් බලනවිට නිවර්තන වර්ෂා වනාන්තර ඒවායේ පිහිටීම අනුව මුළු මිනිස් සංහතියට පමණක් සත්ත්ව සංහතියට ද විශාල සේවයක් සලසන අපූර්ව නිර්මාණයකි. මේවා අනෙක් ප්‍රදේශවලින් විශේෂ වන්නේ අධික උෂ්ණත්වය, වර්ෂාපතනය, සූර්යාලෝකය ලැබීම යන කරුණු හේතුකොටගෙන ය. ඉහත කී කරුණු තුන ම වනාන්තර වර්ධනයට ඉතාමත් හිතකර වේ. එම නිසා එම වනාන්තර ලෝකයේ සාරවත් ම පරිසර පද්ධතියට ඇතුළත් වේ. මේවා සදාහරිත වනාන්තර ලෙස ද නම් දරයි. මෙහි දී සදාහරිත යනුවෙන් අදහස් කරන්නේ ශීත ඍතුවේ දී ද කොළ හැලීමක් නොමැති ව වසර මුළුල්ලේ ම කොළ පැහැයෙන් දිස්වෙන වනාන්තරයි. අවම වශයෙන් මෙහි වැඩෙන ගස් මීටර් **30** ක් පමණ උසින් යුතු ය. මෙම වනාන්තර සකස් වී ඇත්තේ විවිධ මට්ටමේ

ශාක ප්‍රජාවන්ගේ පිහිටීම හේතුකොටගෙන ය. වියන් ස්ථරය මින් ප්‍රධාන තැනක් ගනී. එය හිරුරැස් පොළොවට වැටීම බොහෝදුරට වළක්වයි. මිනිසා තමන්ට අවශ්‍ය දැව හා දර ලබාගැනීම සඳහා මෙම වනාන්තර හෙළිකිරීම ඒවාගේ පැවැත්මට විශාල බාධාවක් වන බව බොහෝ දෙනාගේ මතයයි.

**(i)** පරිසරවේදීන්ගේ අර්ථකථනය අනුව විශාල ම අනාගත ව්‍යසනය කුමක්ද?

**(ii)** නිවර්තන වනාන්තරවල වැඩනෙ ගස් කොපමණ උසකින් යුක්ත වේ ද?

**(iii)** වියන් ස්ථරය මගින් සිදුකරන ප්‍රධාන කාර්යය කුමක්ද?

**(iv)** සදාහරිත වනාන්තර ලෙස අර්ථකථනය කරන්නේ කුමන ලක්ෂණ සහිත වනාන්තර ද?

**(v)** නිවර්තන වර්ෂා වනාන්තර ප්‍රදේශ අනෙක් ප්‍රදේශවලින් විශේෂිත වන්නේ කුමන කාරණයක් නිසා ද?

**(ලකුණු 2x5 = 10 )**

**5.** කොවිඩ් 19 රෝගය සඳහා නිර්දේශිත වෛද්‍ය ක්‍රමවලින් බැහැර වී ඖෂධ භාවිත කිරීමේ අවදානම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා අත් පත්‍රිකාවක් සකසන්න. මෙම දැනුවත් කිරීම කරනු ලබන්නේ ජාතික වෛද්‍ය සභාවේ අධිකාරීවරයා යයි සිතන්න.

නැතහොත්

ඔබ පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා න්‍යාය පත්‍රයක් පිළියෙල කරන්න.

**(ලකුණු 15 )**

# කලාප අධ්‍යාපන කාර්යාලය - කොළඹ
# வலயக் கல்வி காரியாலயம் - கொழும்பு
# Zonal Education Office - Colombo

අ.පො.ස.(සා/පෙළ) විභාගය - ආදර්ශ ප්‍රශ්න පත්‍රය
க.பொ.த. (சா/த) பரீட்சை - மாதிரி வினாத்தாள்
G.C.E.(O/Level) Examination - Model Paper


| 11 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය iii | කාලය: පැය 02 |
|---|---|---|---|

සැලකිය යුතුයි : උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

- ❖ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- ❖ මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු ගණන 80 කි.

**1.** (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

**(i)** "එසේ හෙයින් කල් නොයවා යහපත් නැකැතෙකින් වහා නික්මුණු මැනැවැ"

(අ ) මෙම ප්‍රකාශය කරන්නේ කවුරුන් ද?

(ආ) මෙසේ නික්මෙන්නට අදහස් කරන්නේ කුමන කාරණයක් සඳහා ද?

**(ii)** කැර මිණි බරණ රැස්
රසින් <u>සුර සැවු</u> සුවහස්
සුරන් සහ සහසැස්
.....................................

(අ ) මෙහි හතරවන පද්‍ය පාදය ලියන්න.

(ආ) ඉරි ඇඳි පදයේ අදහස ලියන්න.

**(iii)** "එයා ගමට ගියේ නැහැ. මිනිස්සු කියනවා එයා මැරිලයි කියලා. ඒක ඇත්ත ද?"

(අ ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ පුද්ගලයා කවරෙක් ද?

(ආ) මෙහි 'එයා' යනුවෙන් හැඳින්වෙන්නාගේ නම කුමක්ද?

**(iv)** ජාතික රණ දෙරණ මතේ
<u>ගැටී වැටී</u> මළ මොහොතේ
සුන්දර සුරඹුන්ගෙ අතේ
නැළවෙන බව සිතනු පුතේ

(අ ) ඉරි ඇඳි පදවල ඇතුළත් කාව්‍යාලංකාරය කුමක්ද?

(ආ) මෙම පැදි පෙළේ රචකයාගේ නම ලියන්න.

(v) සියලු භෝග වස්තු ඉසුරු
හරිති නෙක් දනෝ
සව් සැප දෙන සිතුමිණ වන්
ප්‍රේමය සන්දා
(අ ) මෙම ප්‍රකාශය කරන්නේ කවුරුන්ද?
(ආ) මෙම කොටසෙහි ඇතුළත් උපමාව කුමක්ද?

(vi) (අ ) කෘෂිකර්මාන්තය හා බැඳුණු ජනකවි වර්ග දෙකක් ලියන්න.
(ආ) 'හානා හීය පානා අඬහැරෙන් දැනේ' කවි පෙළ අයත්වන්නේ කවර ජනකවි ගණයකට ද?

(vii) (අ ) 'දරු නැළවිල්ල' හෙවත් 'ජාතික තොටිල්ල' නමැති දිර්ඝ කාව්‍ය පන්තිය රචනා කිරීම ඇරඹෙන්නේ කවර ස්ථානයකදී ද?
(ආ) ගුත්තිල කාව්‍ය රචනා කරන ලෙස ආරාධනය කරන ලද්දේ කවුරුන් විසින්ද?

(viii) "තියෙන දෙයක් විකුණලා හරි සල්ලි හොයා ගත්තා කියමුකො. කෝ, ඉතින් බාස්ලා?"
(අ ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවුරුන් ද?
(ආ) 'බාස්ලා' උවමනා කරන්නේ කුමක් සඳහා ද?

(ix) (අ ) අමාවතුර ග්‍රන්ථය රචනා වූ යුගය කුමක් ද?
(ආ) අඟුල්මල් දමනය එම ග්‍රන්ථයේ කී වැනි පරිච්ඡේදයෙහි ඇතුළත් වේ ද?

(x) (අ ) සිංහල සන්දේශ කාව්‍යයන්ගේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන්නේ කුමන යුගයක් ද?
(ආ) එම යුගයේ ලියවුණු සංදේශ කාව්‍ය දෙකක් ලියන්න.

( ලකුණු 2x10 = 20 යි )

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) 'ඒ විද්දත් දුවගේ හාවභාව ලීලා දැක <u>වයොධාත්වාධික</u> රූප කාලාප <u>විකාරයක්</u> බලවත් නියා යයි නො සිතා....'
(අ ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) මෙම පාඨය ඇතුළත් ග්‍රන්ථයේ නම සහ එහි කතුවරයාගේ නම ලියන්න.

(ii) නොයෙක් තැන ම පිපි මල් පිරුණු පොකුණු ය
ගෙයක් කන ම සැදැහෙන් දෙවන <u>දකුණු ය</u>
සුදක් ලෙස තිබෙයි මළු මං හැර කුණු ය
සියක් අය කෙරෙති වැඳ පුද <u>පැදකුණු ය</u>

(අ ) මෙම පද්‍යයෙන් පැවසෙන ස්ථානයේ නම කුමක්ද?

(ආ) ඉරි ඇඳි පදවල අර්ථ වෙන වෙනම ලියන්න.

**(iii)** 'නුවණින් සියලු දඹදිව තමන්ට දෙවන කෙනෙකුන් නැති, සිරිවඩ්ඩන සිටාණන් පුතණුවෝ'

(අ ) මෙම ප්‍රකාශය කරන්නේ කවුරුන් ද? කවරෙකු පිළිබඳව ද?

(ආ) මේ පාඨය හා සම්බන්ධ අවස්ථාව කුමක් ද?

**(iv)** "වහන්සේ තොප පියෙ කවර? මවු කවර? යි පිළිවිත"

(අ ) මෙහි සඳහන් මව සහ පියාගේ නම ලියන්න.

(ආ) මේ ප්‍රකාශය කවුරුන් විසින් කා හට කියන ලද ද?

**(v)** "යටත්නි, මපුතු මා කෙරෙහි නො බිඳැ-පියාටියාව යි නෙරැ-'පීයැ"

(අ ) මෙසේ නෙරැපීමට ලක්වනනෝ කවරහු ද?

(ආ) ඔවුන් පැමිණෙන්නේ කවර කාරණයක් පැවසීමට ද?

**( ලකුණු 4x5 =20 යි )**

**3.** **(i)** සක්දෙව් රජුගේ උපකාරයත්

**(ii)** දෙව්ලියන්ගේ මනහර රංගනයත්

ගුත්තිල පඬිතුමාගේ ජයග්‍රහණයට හේතු විය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

<u>නැතහොත්</u>

**(i)** අවශ්‍ය තන්හී හාස්‍යය හා උපහාසය මතු කිරිම

**(ii)** උචිත උපමා හා යෙදුම් භාවිතයත්

'උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව' රසවත් වීමට ඉවහල් විය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

**( ලකුණු 15 යි )**

**4.** **(i)** **විරුද්ධවාදීන්ගේ උපක්‍රම ව්‍යර්ථ කිරීමත්**

**(ii)** **අවශ්‍ය අවස්ථාවල දී නිවැරදි තීරණ ගැනීමත් නිසා**

**'මහෞෂධ පණ්ඩිතුමාගේ' චරිතය සුවිශේෂී ය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.**

<u>නැතහොත්</u>

**(i)** **සැප සම්පතින් පිරුණු ඉපැරණි ගමක තොරතුරු ඉදිරිපත් කිරීමටත්**

**(ii)** **විහාරස්ථානයකින් ඉටුවිය යුතු වගකීම පිළිබඳව පැවසීමටත් 'හංස සන්දේශ' කතුවරයා දක්වා ඇති කුසලතා අගය කළ හැකි ය.**

**එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.**

**( ලකුණු 15 යි )**

❖ **5, 6,7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.**

**5.** **'ජාතික තොටිල්ල' පද්‍ය පන්තිය සාර්ථක නිර්මාණයක් බවට පත්වූයේ කවියා යොදා ගෙන ඇති විවිධ කාව්‍ය උපක්‍රම නිසා ය. උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න.**

**( ලකුණු 10 යි )**

**6.** **පාඨකයාගේ සිත දයානුකම්පාවෙන් පුරවාලීමට 'බැද්දේගම' කතුවරයා දැක් වූ ප්‍රතිභාව නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න.**

**( ලකුණු 10 යි )**

**7.** **ශිෂ්‍යයෙකු ශික්ෂාකාමී ලෙස සමාජානුගත වන ආකාරය මැනවින් නිරූපණය කිරීමට 'අඟුල්මල් දමනය' ඇසුරින් ගත් උත්සහය නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.**

**( ලකුණු 10 යි )**